T-113



පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලය

# බෞද්ධ ධාර්මිකත්ව සංකල්පය හා නූතන යුක්ති විනිශ්චය ක්‍රමෝපායයන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

විජයදාස රාජපක්ෂ

ලියාපදිංචි අංකය: **2010/Ph.D/S/2882**

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ දර්ශන විශාරද උපාධි අවශ්‍යතාව සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධය

2013

## සංක්ෂිප්තය

මානව ශිෂ්ටාචාරයත් සමඟ බිහි වූ රාජ්‍ය පාලන ක්‍රමවේදය ඇසුරෙහි නීතිවිද්‍යාව (Jurisprudence) නම් වූ ලොව පැරණිතම විෂයය ආරම්භ වී විකාශය විය. කලින් කල එම විෂයපථයට ආගමික නීතිරීති ද ඇතුළු වී ඇත. විශේෂයෙන් අපරදිග සමාජයෙහි විකාශය වූ ප්‍රජාතන්ත්‍රවාදයත් සමඟ නීති විද්‍යාවේ පදනම ලෙස යුක්තිය (Justice) සංකල්පය වර්ධනය විය. මේ වන විට එම නීති සංකල්පය අපරදිග මෙන් ම පෙරදිග ද ප්‍රජාතන්ත්‍රවාදී රටවල නීතිය හැසිරවීමෙහි ලා ප්‍රමුඛත්වයකින් යුතුව ක්‍රියාත්මක වේ. සමාජයේ යහපැවැත්ම හා සදාචාරය ආරක්ෂා කරනු වස් නෛතික ක්‍රියාවලියක් මඟින් පුද්ගලයා යුක්තිගරුක කිරීම මෙයින් බලාපොරොත්තු වේ. ක්‍රිස්තු පූර්ව 18 වන ශතවර්ෂයේ පමණ සංගෘහීත වූ හම්මුරාබිගේ නීති සංග්‍රහයේ පටන් ග්‍රීක රෝම අධිරාජ්‍ය මඟින් පැතිර ගිය නීති පද්ධතියෙහි වරදට දඬුවම (ඇහැට-ඇහැ, අතට-අත) සංකල්පය මූලික යුක්ති ධර්මයක් ලෙස සාධාරණීයකරණය වී ලොව පුරා ව්‍යාප්ත ව ඇත. මෙම තත්ත්වය මඟින් සත්‍ය ලෙස ම සිදු වනුයේ පලිගැනීම හා ප්‍රචණ්ඩත්වය ඉස්මතු වීම සහ එමඟින් සමාජ පරිහානිය මෙන් ම මානව ගුණාංග හීන වීම බව ප්‍රකට ව පෙනෙන්නට ඇත.

යුක්ති සංකල්පය බිහි වීමට බොහෝ කාලයකට පෙර සිට පෙරදිග සමාජයෙහි "ධම්ම" හෙවත් "ධාර්මිකත්වය" (Righteousness) පිළිබඳ සංකල්පය ගොඩනැඟී ඇත. වේද ග්‍රන්ථ ඇතුළු ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ යනාදිය එයට ඇති ඓතිහාසික සාක්ෂි වේ. පුද්ගලයා ජීවත් වීමේ දී අනුගමනය කළ යුතු සිරිත්විරිත් "ස්වධර්ම" වශයෙන් සැලකූ අතර ධර්මය නිත්‍ය බවත්, එය මුළු මහත් විශ්වයේ ම උත්කෘෂ්ට ආත්මයේ ප්‍රකාශනයක් බවත් පිළිගනු ලැබෙයි. ධර්මය යන්නට ආචාර ධර්ම මෙන් ම ශීලය ද ඇතුළත් ය. එහි දී අවිහිංසාව, ශාන්තිය, ඉන්ද්‍රිය සංවරය, කරුණාව, දන් දීම, පාරිශුද්ධත්වය, සත්‍යවාදී වීම සහ තපස් රැකීම ප්‍රධාන තැනක් ගනු ලැබී ය.

ධර්මය පුද්ගලයාගේ පටන් රාජ්‍ය පාලනතන්ත්‍රය මෙන් ම ජාත්‍යන්තර නීතිය දක්වා වූ වපසරිය ආවරණය කරයි. දශරාජ ධර්මය, දස සක්විති වත්, සප්ත අපරිහානීය ධර්ම යනාදියෙන් සමන්විත රාජ්‍ය පාලන ධර්ම මෙන් ම පන්සිල්, අටසිල්, දසසිල් වැනි පුද්ගල අධ්‍යාත්මය සංවර්ධනය කරන්නා වූ ධර්මතාවනුත් "ධාර්මික" සංකල්පයට ඇතුළත් ය. එහි පලිගැනීම, වෛරය, ක්‍රෝධය යනාදියට ඉඩක් නැත. ඊට හේතුව එය පුද්ගලයා විසින් පූර්ණ සත්‍ය හා ආගමික අත්දැකීම් මඟින් අවබෝධ කර ගනු ලැබීම යි.

ක්‍රිස්තු පූර්ව හය වන සියවසේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ බෞද්ධ ධර්මය මඟින් ධර්මය යන්නට වඩාත් ම උත්කෘෂ්ට සහ උත්තරීතර අර්ථයක් ඇතුළත් කර ඇත. ඒ අනුව පුද්ගලයා ධර්මය ස්වයංභූඥානයෙන් ම අවබෝධකරගනු ලබන අතර ඔහු ධර්මය රකින්නේ කිසිවකට ඇති බිය නිසා හෝ සමාජයෙන් ගැරහුම් ලැබේ යැයි ඇති

චකිතයක් නිසා හෝ නො වේ. **"ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරිං"** යන බුද්ධ දේශනාවට අනුව ධර්මානුකූල ව ජීවත් වන්නා ධර්මය විසින් ම රක්නේ ය.

**"සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා**

**සචිත්තපරියොදපනං - ඒතං බුද්ධානසාසනං"**

යනුවෙන් දේශනා කරනු ලැබුවේ සියලු අකුසලයන්ගෙන් වැළකී කුසල් රැස් කිරීමත්, සිත පිරිසිදුව තබා ගැනීමත් සියලු බුදුවරයන්ගේ අනුශාසනාව හෙවත් ධර්මය ලෙස ය. පුද්ගලයාගේ ජීවිතයේ අවසාන විමුක්තිය සාක්ෂාත් කර ගැනීම පිණිස ඇති එක ම මාර්ගය චතුරාර්ය සත්‍යය බවත්, එමගින් ලෝකය පිළිබඳ යථාර්ථය අවබෝධ කර ගත හැකි බවත් ධර්මය මඟින් ප්‍රකට වේ. ධර්මය අවබෝධ කර ගැනීමට ගිහි පැවිදි භේදයක් නැත.

ධර්මය පුද්ගලයාගේ ලෞකික මෙන් ම ලෝකෝත්තර සුගතිය සඳහා මාර්ගය වේ. අපරදිග යුක්ති සංකල්පය හුදෙක් ලෞකික වන අතර ඊට ලෝකෝත්තර අරමුණු මුදුන්පත් කර ගැනීමේ ක්‍රමයක් ඇතුළත් වන්නේ නැත. නූතන යුක්ති විනිශ්චය ක්‍රමෝපායවලට වඩා බෞද්ධ ධාර්මික සංකල්පය ඉදිරියෙන් ඇති බව විග්‍රහ කිරීම පිණිස මෙම සංකල්ප දෙක තුලනාත්මක ව පර්යේෂණය කිරීම මෙම නිබන්ධයෙහි මුඛ්‍ය අරමුණ විය. එමගින් නූතන යුක්ති සංකල්පයෙහි ඌනතා හඳුනා ගෙන ඒවා නිවැරදි කර ගැනීමට සුවිශාල දායකත්වයක් සැලසීමට මෙමගින් බලාපොරොත්තු වේ. බෞද්ධ ඉතිහාසයෙහි "ධාර්මික" (Rightiousness) සංකල්පය සහ අපරදිග ඉතිහාසයෙහි "යුක්තිය" (Justice) සංකල්පය භාවිත වී ඇති ආකාරය මෙහි පැහැදිලි කොට ඇත. මෙම සංකල්ප දෙකෙහි සම-විෂමතා සහ ඒවායෙහි සුවිශේෂතා හඳුනා දීමට හැකි ය. බෞද්ධ ධාර්මික සංකල්පය, එහි ආචාරවිද්‍යාත්මක පදනම, මනෝවිද්‍යාත්මක පදනම හා ආධ්‍යාත්මික පදනම මත විග්‍රහ කර ඇත.

අපරදිග යුක්ති සංකල්පය ආචාරශීලී නිරවද්‍යතාව, ව්‍යවහාර සත්‍යයට සහ නීතියට අනුකූල වීම, නිවැරදි හේතුව සහ නීතිමය පාලනය යන අංශ යටතේ භාවිත වී ඇත. ජස්ටීනියන් නම් ප්‍රකට රෝම නීතිවේදියා එය අර්ථ නිරූපණය කර ඇත්තේ සමාජයේ යම් දෙයක් හෝ ස්ථානයක් ලැබිය යුත්තාට ම නිසි පරිදි හිමි කර දීම නීතියේ සදාතනික අරමුණ හා බලාපොරොත්තුව යනුවෙනි. ඒ අනුව ධාර්මික සංකල්පයේ ප්‍රථම පදනම වන ආචාර විද්‍යාත්මක පදනම හෙවත් ශීලය පමණක් අපරදිග යුක්ති සංකල්පයට ඇතුළත් වන බව පැහැදිලි ය.

අපරදිග යුක්ති සංකල්පය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරන්නේ නීතියේ ආධිපත්‍යය (Supramacy of Law) වේ. එහෙත් වර්තමාන ලෝකයට වඩාත් ඵලදායී වන්නේ නීතියේ ආධිපත්‍යය නොව ධර්මයේ ආධිපත්‍යය යි ( Supramacy of *Dhamma*).